



රූපය 4.11 - රාස්ටර් ග්‍රාපික සහ වෙක්ටර් ග්‍රාපික අතර වෙනස

## ග්‍රාපික මෘදුකාංගයක් භාවිතයෙන් ස්ථිතික ග්‍රාපිකයක් නිර්මාණය කිරීම

ස්ථිතික ග්‍රාපිකයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු මෘදුකාංග බොහෝ ඇත. ඉන් කිහිපයක ලැයිස්තුවක් ඉහත දී හඳුන්වා දෙන ලදි. එහෙත් බොහෝ මෘදුකාංග මිල දී ගත යුතු ඒවා වීම හා සෑම මෙහෙයුම් පද්ධතියක් සඳහා ම අනුකූල නොවීම නිසා ඔබට අපහසුවක් වන බැවින්, අන්තර්ජාලය ඔස්සේ පහසුවෙන් බාගත හැකි, නිදහස්, බොහෝ මෙහෙයුම් පද්ධතිවල ස්ථාපනය කළ හැකි මෘදුකාංගයක් හඳුනා ගනිමු.

## GIMP මෘදුකාංගය


GIMP යනු GNU නැමැති නිදහස් මෙහෙයුම් පද්ධතිය සඳහා නිර්මාණය කරන ලද ග්‍රාපික හැසිරවීමේ මෘදුකාංගයේ (Image Manipulation Program) සංකේත නාමයයි.

නිදහස් මෘදුකාංගයක් වන මෙය ඡායාරූප ප්‍රතිසංස්කරණය, ග්‍රාපික නිර්මාණය, සංස්කරණය සහ හැඩසවීම සඳහා යොදා ගත හැකි ය. බොහෝ මෙවලම් සහිත මෙම මෘදුකාංගය සරල චිත්‍රයක් නිර්මාණ කිරීමේ සිට උසස් තත්ත්වයේ ඡායාරූප සංස්කරණය දක්වා ද යොදා ගත හැකි ය. මෙය රාස්ටර් ප්‍රරූපණ මෘදුකාංගයකි.

UNIX මෙහෙයුම් පද්ධතිය මත ක්‍රියාකිරීම සඳහා නිර්මාණය කරන ලද GIMP ග්‍රාපික මෘදුකාංගය Microsoft Windows සහ Mac මෙහෙයුම් පද්ධති මත ද ක්‍රියා කරයි.

GIMP පරිගණකයට ස්ථාපනය කිරීම සඳහා http://www.gimp.org/downloads/ භාවිත කරන්න.

## GIMP මෘදුකාංගයේ චිත්‍රක පරිශීලක අතුරුමුහුණත (Graphical User Interface)



























1. ප්‍රධාන මෙවලම් තීරුව
2. මෙවලම් විකල්ප
3. ග්‍රාපික කවුළුව
4. ස්තර, අනුමං, පථ
5. පින්සල්/මෝස්තර/වර්ණ










### 1. ප්‍රධාන මෙවලම් තීරුව (The Main Toolbox)

ග්‍රාපිකයක් සංස්කරණය කිරීමේ දී යොදා ගනු ලබන මෙහි ඇති මෙවලම් අවශ්‍ය පරිදි ලබා ගැනීම සහ වසා දැමීම කළ හැකි ය. ඒ සඳහා,

Edit → Preferences →Toolbox → මෙවලම් ලබා ගැනීම සඳහා enable ද වසා දැමීම සඳහා disable තෝරා ගන්න.

| අයිකනය<br>**Icon** | මෙවලම් නාමය<br>**Name** | කෙටි මං<br>**Shortcut** | විස්තරය |
|---|---|---|---|
| තේරීමේ මෙවලම් (Selection tools) | | | |
|  | Rectangle | ctrl or R | අවශ්‍ය කොටස චතුරස්‍රාකාර හෝ සෘජුකෝණාස්‍රාකාර හැඩයෙන් තෝරා ගැනීමට |
|  | Ellipse | E | අවශ්‍ය කොටස ඉලිප්සාකාර හැඩයෙන් තෝරා ගැනීමට |
|  | Free (Lasso) | F | මූසිකයේ ආධාරයෙන් ග්‍රාපිකයෙහි අවශ්‍ය කොටස අවශ්‍ය හැඩයෙන් තෝරා ගැනීමට |
|  | Fuzzy (Magic Wand) | U | එක ම වර්ණයෙන් යුතු වූ එකට සම්බන්ධ වූ කොටස් තෝරා ගැනීමට |
|  | By Colour | Shift + O | තෝරා ගත් වර්ණය ග්‍රාපිකයේ කොතැනක තිබුණ ද එම වර්ණ සහිත කොටස් තෝරා ගැනීමට |
|  | Scissors | I | තේරීමට අවශ්‍ය කොටස වටයමින් තෝරා ගැනීමට |
|  | Foreground | - | රූපයෙහි පසුබිම තෝරා ගැනීමට |
| වර්ණ ගැල්වීමේ මෙවලම් | | | |
|  | Bucket Fill | Shift + B | තෝරා ගත් කොටසට වර්ණයක් හෝ මෝස්තරයක් යෙදීමට |
|  | Blend (Gradient) | L | තෝරා ගත් කොටසට වර්ණ සම්මිශ්‍රණයක් යෙදීමට |
|  | Pencil | N | තෝරා ගත් කොටස මත වර්ණ යෙදීම සහ තෝරා ගත් පැන්සල් ප්‍රමාණයට අනුව ඉරි ඇඳීම |
|  | Paintbrush | P | තෝරා ගත් පින්සල් ප්‍රමාණයට අනුව සුමට වූ ඉරි ඇඳීමට සහ වර්ණ යෙදීමට |

| | | | |
|---|---|---|---|
|  | Eraser | Shift + E | සාමාන්‍ය මකනයක් ආකාරයට ක්‍රියාකරමින් ග්‍රාපිකය මත ඇඳි ඉරි මකා දැමීමට |
|  | Airbrush | A | වර්ණ පින්සලය මෙන් ග්‍රාපිකය මත වර්ණ විදීමක් ලෙස ක්‍රියාකරමින් වර්ණ ගැල්වීමට |
|  | Ink | K | වර්ණ පින්සලය මෙන් ග්‍රාපිකය මත වර්ණ ගල්වයි. මූසිකය වේගයෙන් ගමන් කරවීමේ දී පින්සලයේ පරිමාව කුඩා වන අතර සෙමින් ගමන් කිරීමේ දී පරිමාව විශාල වේ. |
|  | Clone | C | ග්‍රාපිකයේ තෝරා ගත් කොටසක් වෙනත් ස්ථානයකට පිටපත් කරයි. |
|  | Heal | H | ග්‍රාපිකයේ නොගැළපෙන වර්ණ සහිත ප්‍රදේශ නිවැරදි කරමින් වර්ණ ගල්වයි. |
|  | Perspective Clone | - | දෘෂ්ටිකෝණය වෙනස් කළ පසු ක්ලෝන් මෙවලම ලෙස ක්‍රියා කරයි. |
|  | Convolve (Blur/Sharpen) | Shift + U | ග්‍රාපිකය අඳුරු කිරීම හෝ තියුණු කිරීම කරනු ලබයි. |
|  | Smudge | S | ග්‍රාපිකය බොඳ කරනු ලබයි |
|  | Dodge/Burn | Shift + D | ඩොජ් මගින් ග්‍රාපිකය ආලෝකවත් කරන අතර බර්න් මගින් එය අඳුරු පැහැ ගන්වයි. |
| පරිමිතිය වෙන් කිරීමේ මෙවලම් (Transform Tools) | | | |
|  | Move | M | තෝරා ගත් කොටස චලනය/ එහා මෙහා කිරීමට |
|  | Align | Q | ග්‍රාපිකය එකෙල්ල කිරීමට |
|  | Crop | Shift + C | ග්‍රාපිකය අවශ්‍ය ආකාරයට කප්පාදු කිරීමට |

| | | | |
|---|---|---|---|
|  | Rotate | Shift + R | තෝරා ගත් කොටසක්, තට්ටුවක් හෝ ස්තරයක් අවශ්‍ය ආකාරයට කරකැවීමට |
|  | Scale | Shift + T | තෝරා ගත් කොටසක, තට්ටුවක හෝ ස්තරයක පරිමාව අවශ්‍ය ආකාරයට වෙනස් කිරීමට |
|  | Shear | Shift + S | තෝරා ගත් කොටසක් එක් දිශාවකට තල්ලු කිරීමට |
|  | Perspective | Shift + P | තෝරා ගත් කොටසක් හෝ ස්තරයක් අවශ්‍ය ආකාරයට දෘෂ්ටිකෝණය වෙනස් කිරීම |
| අනෙකුත් මෙවලම් Other tools | | | |
|  | Path | B | හැඩතල සහිත ඉරි ඇඳීම, තෝරා ගැනීම සහ ඒවා වෙනස් කිරීම |
|  | Colour Picker | O | ග්‍රාපිකයේ ඇති ඕනෑ ම වර්ණයක් තෝරා ගැනීම |
|  | Magnify (Zoom) | Z | ග්‍රාපිකයේ සූමය අඩු වැඩි කිරීම |
|  | Measure | Shift + M | දිග ප්‍රමාණය සහ කෝණය පෙන්නුම් කිරීම |
|  | Text | M | අක්ෂර ඇතුළත් කිරීම |

2. **මෙවලම් විකල්ප** (Tool options) - ග්‍රාපික නිර්මාණයේ දී අප විසින් යොදා ගනු ලබන මෙවලමට අනුව වෙනස් වන මෙම තීරුව එම මෙවලම පාලනය කිරීම සඳහා යොදා ගනු ලබයි.

3. **ග්‍රාපික කවුළුව** (Image window) - නිර්මාණය කරනු ලබන ග්‍රාපිකය දර්ශනය කර ගැනීම සඳහා උපකාර වේ. යොදා ගනු ලබන පේළියට අනුව අපට අවශ්‍ය ප්‍රමාණයක් ග්‍රාපික කවුළු විවෘත කර තබා ගත හැකි ය. මෙහි දී කවුළු කිහිපයක් එක විට විවෘත වේ. එසේ නොමැති නම් එක් කවුළුවක් පමණක් විවෘත ව තබා ගැනීම සඳහා අවශ්‍යතාවට අනුව වෙනස් කර ගත හැකි ය. ඒ සඳහා,

Windows → Single-Window Mode තෝරා ගන්න.

4. **ස්තර, අනුමං, පථ** (Layers, Channels, Paths) - මේවා පටිති (Tabs) ලෙසින් දැක්වේ. අවශ්‍ය පරිදි ඒ මත ක්ලික් කිරීමෙන් විවෘත කර ගත හැකි ය.

5. **පින්සල්/මෝස්තර/වර්ණ** (Brushes/Patterns/Gradients) - ග්‍රාපිකය නිර්මාණය කිරීමට මෙන් ම අවශ්‍ය පරිදි වර්ණ ගැල්වීමට මෙම පටිති උපකාරී වේ.

## • ග්‍රාපික මෘදුකාංගයක් භාවිතයේ මූලිකාංග

**ග්‍රාපිකයක් නිර්මාණය සඳහා නව කවුළුවක් ලබා ගැනීම (Opening new Window)** →

- File → New ක්ලික් කිරීමෙන් New Image සංවාද කොටුව (Dialogue box) විවෘත වේ.
- ග්‍රාපිකයේ පරිමාව සඳහා අවශ්‍ය මිණුම් ඒකකය තෝරා ගන්න.
- උස, පළල සකස් කර ගන්න. නැතහොත් කලින් සකස් කරන ලද පරිමාවක් (Template) ලබා ගන්න.
- OK ක්ලික් කරන්න.

**ග්‍රාපිකය අපනයනය කිරීම (Export)** →

- 'File' → 'Export' තෝරා ගන්න.
- 'Image' සංවාද කොටුවේ 'Name' ස්ථානයෙන් ග්‍රාපිකයට නාමයක් ලබා දෙන්න.
- 'Places' ස්ථානයෙන් සුදුසු ස්ථානයක් තෝරා ගන්න.
- 'Select File Type (By Extension)' ස්ථානයෙන් අවශ්‍ය ගොනු ආකෘතිය (File Format) තෝරා ගන්න.
- 'Export' ක්ලික් කරන්න.
  (මෙහි දී විවිධ ගොනු ආකෘතිවලට අනුව ග්‍රාපික සංකෝචනය සිදු වේ.)

**නිර්මාණය කරන ලද ග්‍රාපිකයක් තැන්පත් කිරීම (Saving a created image)** →

- 'File' → 'Save' ක්ලික් කරන්න.
- 'Save Image' සංවාද කොටුවේ 'Name' ස්ථානයෙන් ග්‍රාපිකයට නාමයක් ලබා දෙන්න.
- 'Places' ස්ථානයෙන් සුදුසු ස්ථානයක් තෝරා ගන්න.
- 'Save' ක්ලික් කරන්න.

> සැ.යු.- GIMP මෘදුකාංගය මගින් නිර්මාණය කරන ලද ග්‍රාපික තැන්පත් කිරීමේ දී XCF ගොනු නාම දිගුවට (File extension) අනුව තැන්පත් වේ. (උදා - image1.xcf)

| නිර්මාණය කර තැන්පත් කරන ලද ග්‍රාපිකයක් විවෘත කිරීම (Opening an existing Window) | → | • 'File' → 'Open' ක්ලික් කරන්න.<br>• 'Open' සංවාද කොටුවේ 'Places' ස්ථානයෙන් ලේඛනය තැන්පත් කළ ස්ථානය තෝරා ගන්න.<br>• 'Names' කවුළුවෙන් ග්‍රාපිකය තෝරා ගන්න.<br>• 'Open' ක්ලික් කරන්න. |
|---|---|---|

## GIMP මෘදුකාංගය භාවිතය

### 1. පින්තූර එකතුවකින් ග්‍රාපිකයක් නිර්මාණය කිරීම

නිර්මාණය සඳහා ලබා ගන්නා රූප ලබා ගන්නේ කෙසේ ද ?

- පරිගණකයේ තැන්පත් කර ඇති රූප
- ස්කැනර් යන්ත්‍රයක් මගින් ස්කෑන් කර පරිගණක ගත කරන ලද රූප
- අංකිත කැමරාවක් මගින් ඡායාරූප ගත කර පරිගණක ගත කරන ලද රූප
- අංකිත කැමරාවක් සහිත ජංගම දුරකතනයකින් (Smart phone) ඡායාරූප ගත කර පරිගණක ගත කරන ලද රූප



ඉහත රූපයේ දක්වා ඇත්තේ වෙන් වෙන් වශයෙන් ඇති රූප 3 ක් එක් කරමින් එක් ග්‍රාපිකයක් නිර්මාණය කර ඇති ආකාරයයි. මෙය මෙසේ නිර්මාණය කරමු.

මේ සඳහා ඔබ මේ පරිගණකයේ තැන්පත් කර ඇති හෝ ඔබට පහසුවෙන් සොයා ගත හැකි පින්තූර භාවිත කරන්න.


**පියවර 1 -** GIMP මෘදුකාංගය විවෘත කරන්න.

**පියවර 2 -** එහි මෙනු තීරුවෙන් 'Windows' → 'Single -Window Mode' තෝරා ගන්න.


සැ.යු. - GIMP මෘදුකාංගයේ පරිශීලක අතුරු මුහුණත් කවුළුව දෙයාකාරයකි. එනම් එක් කවුළුවක් (Single -Window Mode) හෝ බොහෝ කවුළු (Multi Windows Mode) වශයෙනි. මෙය නිර්මාණයට පෙර වෙනස් කළ යුතු ය.

පියවර 3 - අවශ්‍ය කරන රූප ලබා ගැනීම සඳහා - 'File → Open'
Open සංවාද කොටුවෙන් රූප තෝරා විවෘත කර ගන්න. මෙම රූප වෙන් වෙන් වශයෙන් විවෘත කළ යුතු බැවින් 'Open as Layers' තෝරා ගැනීමෙන් වළකින්න.


පියවර 4 - මෙවලම් තීරුවෙන් පෙරබිම සහ පසුබිම (Foreground/background) වර්ණ පිළිවෙළින් කළු සහ සුදු ලෙස තෝරන්න. මේ සඳහා රූප සටහනේ දැක්වෙන ආකාරයට වර්ණ සහිත කොටුව මත ක්ලික් කිරීමෙන් අවශ්‍ය වර්ණය තෝරා ගන්න. එසේ නැතහොත් HTML notationහි කළු තේරීමේ දී 000000 සහ සුදු තේරීමේ දී ffffff යනුවෙන් යතුරු ලියනය කර OK කරන්න.




පියවර 5 - නව ග්‍රාපිකයක් සඳහා කවුළුවක් ලබා ගැනීමට 'File → New' ක්ලික් කරන්න.
'Create a New Image' සංවාද කොටුවෙහි පළල - 1200, උස 800px (පික්සල) සකසා 'OK' ක්ලික් කරන්න.
(වෙනත් පරිමා සඳහා 'Templates' යොදා ගත හැකි ය.)



ඉන් පසු GIMP චිත්‍රක පරිශීලක අතුරු මුහුණත මෙසේ දිස් වේ.




**පියවර 6 -** පළමු රූපය තෝරා ගන්න. එයට අදාළ ස්තර මත දකුණු මූසික බොත්තම ක්ලික් කර 'Add an Alpha Channel' තෝරා ගන්න.

> ඇල්ෆා චැනලය (Alpha Channel) මගින් යොදා ගනු ලබන රූපයේ විනිවිද දැකීම ඇති කරයි. සාමාන්‍යයෙන් දෙවැනි රූපය එක් කිරීමේ දී මෙය ස්වයංක්‍රීය ව එකතු වේ. නමුත් ස්තර කවුළුවේ එක් රූපයක් පමණක් ඇති අවස්ථාවේ දී Add an Alpha Channel තෝරා ගත යුතු ය.

**පියවර 7 -** මෙවලම් තීරුවෙන් ඉලිප්සාකාර (Ellipse) තේරීමේ මෙවලම තෝරා ගන්න.
'Tool options → Feathers' ක්ලික් කර එම මෙවලමෙන් තෝරා ගත් රූපය මත ඉලිප්සාකාර ව සලකුණු කරන්න.




**පියවර 8 -** 'Select → Feathers'
'Feather' පික්සල 10ට සකස් කරන්න.
'OK' ක්ලික් කරන්න.
'Edit → Copy Visible' තෝරා ගන්න.




**පියවර 9 -** නව ග්‍රාපික කවුළුව මත ක්ලික් කරන්න.
'Edit' → 'Paste as' → 'New Layer' තෝරා ගන්න.
සකස් කර ගත් රූප කොටස නව ග්‍රාපික කවුළුව මත දිස්වේ.
එහා මෙහා කිරීමේ මෙවලම (Move tool) භාවිතයෙන් රූපය කවුළුව මත ස්ථාන ගත කරන්න.

**පියවර 10 -** මෙම නිර්මාණයේ දී සෑම රූපයක් ම එක ම ප්‍රමාණයෙන් වීම සුදුසු බැවින් ඒ සඳහා, මෙවලම් තීරුවෙන් Scale Tool තෝරා ගන්න.
රූපය මත ක්ලික් කරන්න.
Scale සංවාද කොටුවෙන් රූපයේ පළල සහ උස පිළිවෙළින් පික්සල 450, 600 ලෙස සකස් කරන්න.
Scale ක්ලික් කරන්න.




**පියවර 11 -** ඉහත පියවර 5, 6, 7, 8, 9, 10 සහ 11 දැක්වූ ආකාරයට පියවර අනුගමනය කරමින් ඉතිරි රූප දෙක ද ග්‍රාපික කවුළුව මතට ගෙන එන්න. ස්ථාන ගත කරන්න. පරිමාව වෙනස් කරන්න.


මෙම ස්තර Layers සියල්ල ස්ථාන ගතවීම මෙසේ දැක්වේ.



ස්තර (Layers)

සංකීර්ණ මෙන් ම සරල ග්‍රාපික නිර්මාණයක් සඳහා ද ස්තර භාවිතය ඉතා වැදගත් වේ. ග්‍රාපික නිර්මාණයක් තුළ වස්තු යෙදීමේ දී වෙන් වෙන් වශයෙන් ස්තර භාවිත කිරීම මගින් එම වස්තු හැසිරවීමට පහසු වේ. ස්තර යනු විනිවිද පෙනෙන කඩදාසි සමූහයක් මෙනි. නමුත් සමහර අවස්ථාවල දී එකක් මත එකක් වස්තු එකතු කිරීම නිසා ඊට පහතින් ඇති ස්තරය නො පෙනී යයි.

- ස්තර කවුළුව මත එකිනෙක රූප සඳහා වෙන් වෙන් වශයෙන් ස්තර යෙදිය යුතු ය.
- එම නිසා අදාළ ස්තරය හා සම්බන්ධ වෙනස් කිරීම් අනෙකුත් ස්තර සඳහා බලනොපායි. (පාඨ යෙදීම, වර්ණ යෙදීම, හැඩතල, සංස්කරණ ආදිය)
- ස්තරය දෘශ්‍යමාන වීම හෝ නොවීම හෝ සඳහා ඇස (eye) උපයෝගි කර ගන්න.
- ස්තර කවුළුවේ පහත තීරය ස්තර සඳහා වූ නොයෙකුත් වෙනස්වීම් සඳහා යොදා ගන්න.




1. නව ස්තරයක් (New)
2. ස්තර කණ්ඩායම් (Group)
3. ස්තර ස්ථානගත වීම (Move)
4. ස්තර අනුපිටපත් (Duplicate layers)
5. ස්තර නැංගුරම් දැමීම (Anchor)
6. ස්තර ඉවත් කිරීම සඳහා (Delete)

- පාරාන්ධතාව (Opacity) - ස්තර කවුළුවේ ඉහළින් දැකිය හැකි ය. තෝරා ගත් ස්තරයක පාරාන්ධතාව (Opacity) අඩු හෝ වැඩි හෝ කිරීම මගින් එම ස්තරයට පහතින් ඇති ස්තරය දර්ශනය වීම අඩු හෝ වැඩි හෝ වේ.




පියවර 12 - ස්ථානගත කිරීම සහ සංස්කරණ අවසන් වූ පසු ස්තර සියල්ල එකට එකතු කර එක් ස්තරයක් බවට පත් කිරීමට අවශ්‍ය වේ. ඒ සඳහා, ස්තර කවුළුව මත දකුණු මූසික බොත්තම ක්ලික් කර, 'Merge Visible Layers' → 'Expand as necessary' → 'Merge' ක්ලික් කරන්න.

පියවර 13 - සකස් කරගත් ග්‍රාපිකයේ අනවශ්‍ය කොටස් ඉවත් කිරීම සඳහා කැපීමේ මෙවලම (Crop) භාවිත කර අවශ්‍ය ප්‍රදේශය පමණක් තෝරන්න.

පියවර 14 - ග්‍රාපිකයට බෝඩරයක් එකතු කිරීම සඳහා, 'Filter' → 'Decor' → 'Add' Border බෝඩර් X -10, බෝඩර් Y -10, බෝඩර් වර්ණය නිල් → Ok බෝඩර් X -15, බෝඩර් Y-15, බෝඩර් වර්ණය කහ → OK ඉහත දැක්වූ ලෙස වාර දෙකකින් බෝඩර් යොදන්න.




පියවර 15 - ග්‍රාපිකය තැන්පත් (Save) කරන්න. ඉන් පසු එය අපනයනය (Export) කරන්න.

2. පාඨ සහිත ග්‍රාපික නිර්මාණය





පියවර 1 - GIMP මෘදුකාංගය විවෘත කරන්න.

පියවර 2 - නව ග්‍රාපිකයක් සඳහා කවුළුවක් ලබා ගැනීමට 'File' → 'New' ක්ලික් කරන්න.
'Create a New Image' සංවාද කොටුවෙහි පළල - 640, උස 400px (පික්සල) සකසා 'OK' ක්ලික් කරන්න.



පියවර 3 - පසුබිම් වර්ණය සකස් කිරීම සඳහා, Foreground සහ Background වර්ණ සඳහා පිළිවෙළින් HTML notation අගය 29c89c, e3216a යනුවෙන් වෙනස් කර වර්ණ ලබා ගන්න.
ඉන් පසු 'Gradient' මෙවලම තෝරා ගන්න.

පියවර 4 - මූසිකය ක්ලික් කරමින් පසුබිම කවුළුවේ (Background window) වම් කෙළවරේ සිට දකුණු කෙළවර දක්වා ඉරක් අඳින්න. තෝරා ගත් වර්ණවලට අනුව පසුබිම වර්ණ ගැන්වේ.



**පියවර 5 -** පාඨයක් එකතු කිරීම සඳහා,

මෙවලම් කොටුවෙන් අක්ෂර මෙවලම තෝරා ගන්න. එවිට මෙවලමේ විකල්ප තීරුව (Tool options) එයට අනුරූපී ව වෙනස් වේ. පාඨයට ගැළපෙන ආකාරයට පහත දැක්වෙන ඒවා මෙසේ සකස් කරන්න.


- අකුරු වර්ගය Gill Sans Ultra Bold හෝ පළල සහිත, අකුරු වර්ගයක්
- අකුරු ප්‍රමාණය 72 Size
- කළු වර්ණය Color




ඉන් පසු කවුළුව මත ක්ලික් කර NATURE යනුවෙන් යතුරුලියනය කරන්න. 'Move' මෙවලම භාවිත කර කවුළුවේ මැදට ස්ථාන ගත කරන්න.


**පියවර 6 -** පාඨය වටා බෝඩරයක් දැමීම සඳහා

ස්තර කවුළුවේ පාඨය සහිත ස්තරය තෝරන්න. පහත තීරුවෙන් නව ස්තරයක් (Layer) ලබා ගන්න. එය 'Text border' ලෙසින් නම් කරන්න. ඊතල භාවිත කරමින් 'Text border' ස්තරය පාඨ ස්තරයෙන් පහළට ස්ථානගත කරන්න.












**පියවර 7 -** පාඨ ස්තරය තෝරන්න, දකුණු මූසික බොත්තම ක්ලික් කර 'Alpha to selection' තෝරන්න.

**පියවර 8 -** තෝරා ගත් ප්‍රමාණය වැඩි කිරීම සඳහා,
'Select' → 'Grow' තෝරන්න. 'Grow Selection' ප්‍රමාණය පික්සල 2ක් දක්වා වැඩි කර 'OK' ක්ලික් කරන්න.



**පියවර 9 -** 'Text border' ස්තරය තෝරා ගන්න.
පෙරබිම වර්ණය (Foreground colour) සඳහා සුදු (white) වර්ණය ද වර්ණ යෙදීම සඳහා 'Bucket fill' මෙවලම ද තෝරා පාඨය මත ක්ලික් කරන්න. ඉන් පසු 'Select' → 'None' තෝරන්න.

**පියවර 10 -** පාඨයට සෙවණැල්ලක් (Shadow) එකතු කිරීම 'Text border' ස්තරය තෝරා ගන්න.
මෙනු තීරයෙන් 'Filters' → 'Light and Shadow' → 'Drop Shadow' තෝරන්න. රූපයේ දක්වා ඇති ආකාරයට සකස් කරන්න. 'OK' ක්ලික් කරන්න.




**පියවර 11 -** ස්ථාන ගත කිරීම අවසන් වූ පසු ස්තර සියල්ල එකට එකතු කිරීමට අවශ්‍ය වේ. ඒ සඳහා, ස්තර කවුළුව මත දකුණු මූසික බොත්තම ක්ලික් කර, 'Merge Visible Layers' → 'Expand as necessary' → 'Merge' ක්ලික් කරන්න.

**පියවර 12 -** මීට පෙර ඉගෙන ගත් ආකාරයට ග්‍රාපිකයට බෝඩරයක් එකතු කරන්න. නිවැරදි ස්ථානයක තැන්පත් කරන්න. අපනයනය කරන්න.

සැ.යු. - මෙම ග්‍රාපිකයේ පසුබිම සකස් කිරීම සඳහා විවිධ වර්ණ මෙන් ම මෝස්තර (Pattern) ද යොදා ගත හැකි ය. තෝරා ගත් මෝස්තරය මත මූසිකය ක්ලික් කර එය ඇදගෙන ගොස් පසුබිම මත අතහරින්න (Drag and drop).
විවිධ රූප එකතු කර පසුබිම් තලයක් නිර්මාණය කිරීමට ද උත්සාහ ගන්න.

**උදාහරණ**

